# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,125 — 1960 මැයි 6 වැනි සිකුරාද — 6.5.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... | 313 | කොටුපල් ටෙන්ඩ‍ර් හා වෙනත් ටෙන්ඩ‍ර් විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 317 | ආණ්ඩුවේ නොවන දැන්වීම ... ... | — |
| වැන්ඩර් කැඳවීමේ දැන්වීම ... ... | 317 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ වැන්ඩර් පත් පිළිබඳ දැන්වීම ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 328 | විවිධ දැන්වීම ... ... ... | — |


## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායනී සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. නවප්‍රවේශක නිලධාරීනු.—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ"යි ඔවුන් එන තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සැලෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

6. මෙම තනතුරු ඉල්ලුම් කිරීමට සුදුසුකම් ඇති ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් විෂයයන් පිළිබඳ පරීක්ෂණයකට පෙනී සිටිනු ලැබීමද අවශ්‍ය වන්නේ ය. එනම්—

1. අංක ගණිතය හා විජ ගණිතය, 2. ජ්‍යාමිතිය, 3. ද්‍රව්‍ය ප්‍රමාණයන් ගණන් ගැනීම, 4. මිනුම් හා සමතලා කිරීම, 5. සැලැස්ම ඇඳීම හා පිටපත් කිරීම, 6. මූලික ගොඩනැගිලි වැඩ, හා 7. පාරවල් තැනීම හා නඩත්තු කිරීම.

මෙම පරීක්ෂණයෙන් ප්‍රමාණවත් තත්ත්වයකට පැමිණෙන ඉල්ලුම් කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලැබේ.

7. තවද මෙම ගැසට් පත්‍රයේ i වැනි ඡෙදයේ (ii) වැනි කාණ්ඩයේ මුල පළකොට ඇති රාජ්‍ය සේවා තනතුරු සඳහා කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ සාමාන්‍ය කොන්දේසි කෙරෙහිද ඉල්ලුම් කරුවන්ගේ අවධානය මෙයින් යොමුකර සිටිනු ලැබේ.

වී. සී. ජයසූරිය,
වැඩබලන පළාත් පාලන කොමසාරිස්.

1960වේ අප්‍රේල් 27 වැනි දින,
කොළඹ, පළාත් පාලන කාර්යාලයේ දීය.

### ඉහත සඳහන් කරන ලද ඉල්ලුම් පත්‍ර ආකෘති පත්‍රය

#### ග්‍රාමීය කර්මාන්ත අධිකාරී තනතුර පිළිබඳවූ ඉල්ලුම්පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. උපන් දිනය :————.
4. 1960. 5. 23 වැනි දිනට නියමිත වයස—
   අවුරුදු——මාස——දවස්——
5. ඉල්ලුම්කරුවාගේ පියාගේ උපන් දිනය හා ස්ථානය :————.
6. ජාතිය :————.
7. (අ) ඉල්ලුම්කරුවාගේ උපන් ස්ථානය :————.
   (ආ) ඉල්ලුම්කරුවාගේ පියාගේ උපන් ස්ථානය :————.
   (ඇ) ඉල්ලුම්කරුවාගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ උපන් ස්ථානය :————.
   (ඈ) ඉල්ලුම්කරුවාගේ පිය පාර්ශ්වයේ මී මුත්තාගේ උපන් ස්ථානය :————.
8. අධ්‍යාපන සුදුසුකම් :————.
9. කාර්මික සුදුසුකම් :————.
10. පාසැලින් අස්වීමෙන් පසුව යෙදී සිටි රක්ෂාවල් :————.
11. දැනට උසුලන තනතුර හා ලබන වැටුප :————.
12. මෙම තනතුරු සඳහා සුදුසුකම් කියා සිටින්නේ දැන්වීමේ 4 වැනි ඡෙදයේ කවර වගන්තියක් යටතේ ද යන වග : ————.
13. මිනුම් හා සමතලා කිරීම්, ගොඩනැගිලි තැනීම්, පාරවල් තැනීම් සම්බන්ධයෙන් ඇති පළපුරුදුකම් පිළිබඳ විස්තර :————.
14. භාෂා පිළිබඳ දැනීම—
    (අ) සිංහල :————.
    (ආ) දෙමළ :————.
15. විශේෂ සුදුසුකම් තිබේනම් ඒවා :————.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන්කර තිබෙන විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මම මෙයින් සහතික කර සිටිමි. මෙහි සඳහන් කිසියම් විස්තරයක් හෝ තොරතුරක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ තෝරාගැනීමට ප්‍රථම දැනගන්ට ලැබුණහොත්, ඒ හේතු වෙන්ම මා මෙම තනතුරට නුසුදුස්සෙකු බවට පත්කරනු ලැබීමටත්, මා මේ තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව එම වරද අනාවරණය වුවහොත් මා රාජකාර්‍යයෙන් පහකර දමනු ලැබීමටත් යටත් විය යුතුව තිබෙන බව මම දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

### කළුතර දිස්ත්‍රික්කයේ මොරගල තානායමේ II වැනි ශ්‍රේණියේ තානායම් භාරකාර තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස කළුතර දිස්ත්‍රික්කයේ ඒජන්ත තැන විසින් මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 540න් පටන්ගෙන රු. 12හේ වාර්ෂික වැඩිවීම් 22 කින් රු. 804 තෙක් නගී. ආණ්ඩුවේ රෙගුලාසි අනුව තාවකාලික ජීවන දීමනාවක්ද ගෙවනු ලැබේ. මේ වැටුපට සහ ජීවන දීමනාවට අතිරේක වශයෙන් පහත සඳහන් දීමනාවන්ද තෝරා පත්කරගනු ලබන තැනැත්තාට ගෙවනු ලැබේ :—

| | | |
|---|---|---|
| (1) රෙදිපිළි සෝදීම සඳහා දීමනාවකට මසකට | ... | රු. 10.00 |
| (2) කසල සෝදන දීමනාව මසකට | ... | රු. 2.50 |
| (3) නාන කාමර පිරිසිදු කිරීමට මසකට | ... | රු. 5.00 |

මෙය ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

3. තානායම් භාරකරුට නිවාඩු දුම්රිය බලපත්‍ර දෙනු ලැබේ. එහෙත් තානායම් භාරකාරවරු සතියේ දින හතම වැඩ කළ යුතු සේවක යන්ගේ ගණයට අයත් වන හෙයින් රජයේ නිවාඩු දිනයන්හි නිවාඩු නො ලැබේ.

4. අයදුම්කරුවන් ලාංකිකයන් විය යුතුයි. 1960 මැයි මස 23 වෙනි දිනට අයදුම් කරුගේ වයස අවුරුදු 25ට අඩු නොවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ තානායම් පලවල් හෝ වෙනත් ආහාරපාන සපයන ස්ථාන පාලනය කිරීම පිළිබඳව පළපුරුද්දක් ඇති අය පමණකි. සිංහල සහ දෙමළ හෝ කියවීමට සහ ලිවීමටද ඉංග්‍රීසි කථා කිරීමට හා තේරුම් ගැනීමටද, හැකි වූ ඉල්ලුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. දේශීය හා බටහිර කෑම වර්ග පිළියෙළ කිරීමේ සමත්කම අවශ්‍යතම සුදුසුකමෙකි. තවද ගණන් තැබීමේ පළපුරුදු කෙනෙක් විය යුතුයි.

5. තෝරාගනු ලබන අයදුම්කරු 3 අවුරුද්දක අස්ථිර කාලයක් ගත කළ යුතුයි. තවද ඔහු ආණ්ඩුවේ සෑම ව්‍යවස්ථා සහ රෙගුලාසි වලට යටත් වන්නේ ය.

6. මෙම තනතුරේ සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික තත්ත්වය කින් සිටීද යන්න දැනගනු සඳහා රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වන වෛද්‍ය පරීක්ෂණයකින් තෝරාගත් අයදුම්කරු සමත් විය යුතුය. මේ හැර අවුරුද්දකට වරක්ද පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි.

7. තෝරාගනු ලබන අයදුම්කරු රු. 1,000ක ඇපයක් තැබිය යුතුයි. මේ ඇප මුදල පත්වූ වහාම රු. 250ක මූලික තැන්පත් මුදලකින් හා ඉතිරි කොටස මසකට රු. 10 බැගින් ගෙවිය යුතු වේ.

8. තෝරාගනු ලබන අයදුම්කරු විසින් සිය පඩියෙන් සියයට 4ක් වැන්දඹු සහ අනාථදරු විශ්‍රාම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුයි.

9. අයදුම්කරුවන් විසින් මෙහි පහත සඳහන් ලියකියවිලි වල පිටපත් තම ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (අංක බී. 78 ඒ දරණ ෆෝර්මයෙහි)
(ii) අධ්‍යාපන සහතික පත්‍ර,
(iii) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක්.

10. ආණ්ඩුවේ සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම් පත් සලකා බලනු ලබන්නේ ස්වකීය දෙපාර්තමේන්තු මගින් එව්වොත් පමණි.

11. අයදුම්කරුවකු ගැන නිර්දේශ කිරීමට අදහස් කරන අයෙකු සහතිකයක් දීමෙන් එසේ කළ යුතුයි. අනියම් ලෙස උදව් සෙවීම හෝ පොළඹවා ගැනීමට තැත් කිරීම අයදුම්කරුවකු නුසුදුස්සෙකු කිරීමට හේතු වේ.

12. තෝරා ගැනීමට පෙර අයදුම් පත්‍රයෙහි සඳහන් යම් කරුණක් අසත්‍ය බව පෙනී ගියහොත් එයින්ම එකී අයදුම්කරුවා නුසුදුස්සෙකු බවට පත්වන අතර තෝරා ගැනීමෙන් පසු එවැන්නක් අනාවරණය වුවහොත් ඔහු රාජකාර්‍යයෙන් පහකර දැමීමට සිදු වේ.

13. අයදුම්කරුවන් නියම කරන දිනයක සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. ඒ සඳහා ගමන් ගාස්තු හෝ වෙනත් කිසිම වියදමක් හෝ ගෙවනු නොලැබේ.

14. මෙහි පහත දක්වෙන ආකෘතියේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් 1960 මැයි මස 23 වෙනි දිනට හෝ ඊට පෙර පුද්ගලික මගේ නමට නොව, "කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන, කළුතර" යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

ඩබ්ලිව්. පතිරණ,
ආණ්ඩුවේ ඒජන්ත තැන.

1960 අප්‍රේල් මස 28 වෙනි දින,
කළුතර කච්චේරියේ දීය.

### ආකෘති පත්‍රය

#### කළුතර දිස්ත්‍රික්කයේ මතුගම තානායමේ II වෙනි ශ්‍රේණියේ තානායම් භාරකාර තනතුර

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) ලිපිනය :————.

(3) ජාතිය (ලාංකිකයෙක්ද නැද්ද යන වග සඳහන් කළ යුතුයි) :————.

(4) අයදුම්කරුගේ උපන් දිනය සහ ස්ථානය :————.

(5) අයදුම්කරුගේ පියාගේ උපන් දිනය සහ ස්ථානය :————.

(6) විවාහකද අවිවාහකද යන වග :————.

(7) අධ්‍යාපනික සුදුසුකම් සහ අවසාන වරට සමත් වූ විභාගය හා දිනය :————.

(8) ඉගෙනීම ලැබූ ස්ථානය සහ පාසැලින් අස් වූ දිනය:————.

(9) (අ) පාසැලින් අස් වූ පසු නිරතවූ රක්ෂා හා වකවානු සහ වෘත්තිය පිළිබඳ සම්පූර්ණ විස්තර:————.

(ආ) මීට ඉහත රජයේ රක්ෂාවක නිරතව සිටියේ නම් ඉන් අස්වීමට හේතුවූ කරුණු සහ සම්පූර්ණ විස්තර : ————.

(ඇ) ත්‍යානායම් භාරකරුවකු සේ රජය යටතේ හෝ පළාත් පාලන සේවා මෙහෙය යටතේ සේවය කර තිබේ නම්; ————.

(ඈ) (i) දැන් දරණ තනතුර, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය:————.

(ii) වර්තමාන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) දින සහිත රැකී රක්ෂා පිළිබඳ වාර්තාව :————.

(10) සිංහල හා දෙමළ කියවීමට, ලිවීමට හා අවබෝධ කර ගැනීමට ඇති දක්ෂතාවය :————.

(11) විශේෂ සුදුසුකම් පිළිබඳව විස්තර :————.

(12) චරිත සහතික පත් ලබාගත් අයගේ නම් සහ දරණ තනතුරු : ————.

(13) ත්‍යානායම් වැඩ ගැන ලබා ඇති පළපුරුද්ද හෝ වෙනත් විශේෂ සුදුසුකම් :————.

(14) ක්‍රිමිනල් අපරාධයක් සම්බන්ධයෙන් නීති උසාවියකින් වරද කරුවකු වී තිබේ නම් එහි දිනය, නඩු අංකය සහ කෙබඳු අපරාධයක්දැයි සඳහන් කරන්න :————.

(15) ණය ගණුදෙනු වලින් හා මුදල් සම්බන්ධ කරදර වලින් නිදහස් අයෙක්ද යන වග :————.

(16) මුදල් තත්ත්වය :————.

————.
අයදුම් කරුගේ අත්සන.

දිනය :————.

---

## "ලංගම" සම්පාදන කොට්ඨාසයෙහි II වෙනි, III වෙනි පන්තිවල ගබඩාකරු පුරප්පාඩු

යථොක්ත තනතුරුවල පුරප්පාඩු පිරවීම සඳහා ඉල්ලුම් පත්‍ර එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. පඩි ක්‍රමය (සියලු දීමනාවන් ඇතුළුව මාසයකට) :

II වෙනි පන්තිය—රු. 250—රු. 10×15—රු. 400.

III වෙනි පන්තිය—රු. 180—රු. 7.50×20—රු. 330.

(තෝරාගනු ලබන අපේක්ෂකයන්ට ඇති සුදුසුකම් සහ පළපුරුද්ද අනුව මේ පඩි ක්‍රමවල සුදුසු පාදයක් දිය හැකිය.)

3. සුදුසුකම් :

II වෙනි පන්තිය :

(i) වයස : 1960.5.1 වෙනි දාට අවුරුදු 45 ට වැඩි නොවිය යුතුයි.

(ii) කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට වඩා උසස් විභාගයකින් සමර්ථවීමත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ වෙළඳ ආයතනයක ගබඩා වැඩ ගැන යටත් පිරිසෙයින් අවුරුදු 5 කවත් පළපුරුද්දක් තිබීමත් ය; නැතහොත් ගබඩා වැඩ ගැන අවුරුදු 10ක වත් පළපුරුද්දකුත් හොඳ සාමාන්‍ය උගත්කමකුත් තිබීම ය.

III වෙනි පන්තිය :

(i) වයස : 1960.5.1 වෙනි දාට අවුරුදු 35 ට වැඩි නොවිය යුතුයි.

(ii) කනිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට වඩා උසස් විභාගයකින් සමර්ථවීමත් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක හෝ වෙළඳ ආයතනයක ගබඩා වැඩ ගැන යටත් පිරිසෙයින් අවුරුදු තුනක වත් පළපුරුද්දක් තිබීමත් ය. නැතහොත් ගබඩා වැඩ ගැන අවුරුදු 5කවත් පළපුරුද්දකුත් හොඳ සාමාන්‍ය උගත්කමකුත් තිබීමය.

මෝටර් අමතර වැඩ කැලිය, සාමාන්‍ය ගබඩා බඩුය, යකඩ බඩුය යන මේවා ගැන දැනුමක් ඇති අයට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

4. රාජ්‍ය සේවාවෙහි හෝ පළාත් පාලන සේවාවෙහි නියුක්ත නිලධාරීන් එවන ඉල්ලුම් පත්‍ර සැලකිල්ලට භාජන කරන්නේ මේ මණ්ඩලය යටතේ ස්ථිර සේවය සඳහා 1957 තේ 48 වෙනි අංකය දරණ මෝටර් ගමනාගමන පණතේ 9 වෙනි වගන්තිය අනුව ඒ නිලධාරීන් නිදහස් කරන බව ඒ ඉල්ලුම් පත්‍ර එවන විට දෙපාර්තමේන්තු ප්‍රධානයන් සඳහන් කළොත් පමණකි.

5. සේවා කොන්දේසි.—තෝරාගනු ලබන අපේක්ෂකයන් තුන් අවුරුදු පරීක්ෂණාත්මක කාලයටද මණ්ඩලීය ව්‍යවස්ථාවන්ට හා රෙගුලාසිවලටද යටත් විය යුතුයි: තනතුරුවලට පත් කිරීමට කලින් ඔවුන් සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණයක් පවත්වනු ලැබේ. පත්වීම් ස්ථිර කිරීමට මත්තෙන් ඔවුන් විසින් සිංහල පිළිබඳ ප්‍රවීණතා විභාගයකින් සමත්විය යුතුයි.

6. වයස ය, අධ්‍යයනික සුදුසුකම් ය, ගබඩා වැඩ ගැන ඇති පළපුරුද්ද ය, දැරූ තනතුරු ය, ලැබුණ පඩිය ය යන මේවා පිළිබඳ සම්පූර්ණ විස්තර ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කළ යුතුයි. තමා ගැන තොරතුරු අසා දැනගත හැකි පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් ද එහි සඳහන් කළ යුතුයි. එසේම උප්පැන්න සහතික පත්‍රය ය, අධ්‍යයන සහතික පත්‍රවල් ය. චරිත සහතික පත්‍රවල් ය යනා මේ ආදියෙහි (මුල් පිටපත් නොව) අනු පිටපත් ද ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ඉල්ලන එක් එක් වගීයේ තනතුර සඳහා සඳහා වෙනම ඉල්ලුම් පත්‍රයක් එවිය යුතුයි. මණ්ඩලීය සේවකයන් විසින් තම ඉල්ලුම් පත්‍ර සවකීය කොට්ඨාශයේ ප්‍රධානයා මගින් එවිය යුතුයි. ඔවුන්ට සෙසු සුදුසුකම් තිබේ නම් වයස් සීමාව හා අධ්‍යයනික සුදුසුකම් ඔවුන් සම්බන්ධයෙන් අත්හැර දැමිය හැකිය.

7. ඉල්ලුම් පත්‍ර, ලියුම්කවරවල දමා "ලංගම" සේවක මණ්ඩල කළමනාකාර මහතා වෙත එවිය යුතුයි. ඉල්ලන තනතුර කුමක් ද කියා ලියුම් කවරයෙහි සඳහන් කළ යුතුයි.

8. මේ නියමවලට නොගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

9. ඉල්ලුම් පත්‍ර බාරගැනීම 1960 වේ මැයි මස 17 වෙනිදා නවත්වනු ලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවකමණ්ඩල
කළමනාකාර තැන.

1960වේ අප්‍රියෙල් මස 30 වෙනි දින
කොළඹ 5, කිරුළ පාරේ
20 වෙනි ස්ථානයෙහිදීය.

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

### බාහිර වරායන්හි ෆෝමන් තනතුර

කොළඹ වරාය කොමිෂන් සභාවේ බාහිර වරායන් පිළිබඳ ෆෝර්මන් තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

පහත දක්වෙන ආකෘති පත්‍රයට අනුව පිළියෙල කරන ලද ඉල්ලුම් පත්‍ර 1960 මැයි මස 20 වෙනි දින හෝ එයට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතුය :—

(2) **වැටුප් හා අතිරේක දීමනා.**—මෙම තනතුරට නියමිත වැටුප් ක්‍රමය වර්ෂයට රු. 3,180—12—180—රු. 5,340කි.

(3) **සේවයට භාරගැනීම පිළිබඳ කොන්දේසි සහ සේවා කොන්දේසි ආදිය.**—(1) මෙම තනතුර තාවකාලිකය. (2) අයදුම්කරු කෙටි දැනුම්දීමකින් වැඩ බාරගැනීමට සූදානම්ව සිටිය යුතුය.

(4) **අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්.**—සෑම ඉල්ලුම්කරුවෙකු විසින්ම පහත සඳහන් පරිදි අවශ්‍ය සුදුසුකම් ඇති බවට සතුටුදායක ලෙස ඔප්පු කළ යුතුය :—

1. (අ) වයස අවුරුදු 50කට නොවැඩි අයට වැඩි සැලකිල්ල දක්වනු ලැබේ.

(ආ) රජයේ දෙපාර්තමේන්තුවක දැනටමත් සිවිල් ඉංජිනේරු ෆෝර්මන් කෙනෙකු විය යුතුය.

(ඉ) විශාල කොන්ක්‍රීට් වැඩ, ශක්තිමත් කළ (රීන්ෆෝස්ඩ්) කොන්ක්‍රීට් වැඩ, ගොඩනැගිලි වානේ වැඩ, ලී දඬු කැනීම, පෙදරේරු වැඩ, ද්‍රව්‍ය පිළිබඳ ඇස්තමේන්තු සකස්කිරීම හා කෙලින්ම කම්කරු පාලනය ගැන යටත් පිරිසෙයින් අවුරුදු 15ක පළපුරුද්දක් තිබිය යුතුය. පූපුරන ද්‍රව්‍ය පාවිච්චිය හා සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් යන්ත්‍රාගාර ගැන පළපුරුද්දකුත් අතිරේක වශයෙන් ඇති අය ගැන වැඩි සැලකිලි දක්වනු ලැබේ.

එසේ නැතහොත්—

2. පහත දක්වෙන කොන්දේසි සපුරාලන රජයේ දෙපාර්තමේන්තුවක පුහුණුව ලබා තිබිය යුතුය :—

(අ) ගණිතය සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත් වීම.

(ආ) රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් වෙළඳ ආයතනයක සිවිල් ඉංජිනේරු ශොඩනැගිම් වැඩ ගැන අවුරුදු 4ක ආධුනිකත්වයෙන් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබීම.

(ඉ) ලංකා කාර්මික විද්‍යාලයේ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ආධුනික පාඨමාලාව සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීම.

(ඊ) අවුගණනේ අවුරුද්දක් සුළු පරිපාලක 1 වැනි ශ්‍රේණියේ කටයුතු කිරීම.

(උ) ඉහත 1 (ඉ) උප ඡේදයෙන් දක්වූ පළපුරුද්ද තිබීම.

එසේ නැතහොත්—

3. (අ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ එයට සරිලන විභාගයකින් සමත් වීම.

(ආ) ඉහත 1 (ඉ) ඡේදයේ දැක්වූ 15 අවුරුද්දක පළපුරුද්ද— මින් යටත් පිරිසෙයින් අවුරුදු පහක් පරිපාලක තත්ත්වයක විය යුතුය.

(5) අයදුම්කරුගේ චරිතය හා මෙම තනතුරට පත් කිරීම සඳහා වූ යෝග්‍ය භාවය දක්වෙන ළඟදීම ලබාගත් සහතික පත් අඩු ගණනේ තුනකවත් පිටපත් එවිය යුතුවේ.

(6) ඉල්ලුම් පත්‍රය හා මේ පිළිබඳවූ වෙනත් සෑම ලියවිල්ලක්ම වරාය කොමසාරිස් තුමා වෙත එවිය යුතු අතර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකු වෙත පුද්ගලිකව කිසිම ලියවිල්ලක් නොඑවිය යුතුය.

(7) ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ සඳහන් රාජ්‍යසේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වෙත යොමු කරනු කැමැත්තෙමි.

ආර්. ආල්. ඩී. කැස්පර්ස්,
වැඩබලන වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1, 1960 මැයි 2 දින.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
4. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය)
5. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :————.
6. පළපුරුද්ද :————.
7. සහතික පත්‍ර ලබාගත් අයගේ නම් සහ තනතුරු :————.
8. වෙනත් සුදුසුකම් :————.

————
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරය අංකය : 1/60/7 (ජී).

### ටයිප් ශසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය 1959 යේ මාර්තු

වර්ෂ 1960ක් වූ අප්‍රේල් මස 22 වැනි දිනය හා අංකය 12,111 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, වර්ෂ 1960 ක් වූ අප්‍රේල් මස 18 වැනි දිනය දරණ නිවේදනය හා සම්බන්ධයි. වර්ෂ 1959ක් වූ මාර්තු මස 28 වැනි දින පවත්වනු ලැබූ ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයා සහ අපේක්ෂිකාව ද ටයිප් ගසන්නන්ගේ සේවයට පත් කර ගැනීමට තෝරාගනු ලැබූ බව මෙයින් දනුම් දෙමි :—

| නම | | ලිපිනය |
|---|---|---|
| රණවීර, ඊ. ඩී. | ... | ප්‍රාදේශීය කාර්යාලය (දකුණ), |
| රණසිංහ, ආර්. ඒ. සී. පී. (මෙනෙවිය) | ... | ලං. ග. ම., ගාල්ල |
| | ... | ගම්මුලාදෑනි මහතා බාරේ, නාගොඩ, කඳාන |

2. ඉහත සඳහන් අපේක්ෂකයාට සහ අපේක්ෂිකාවට පත්වීම් වහාම දීමට ආණ්ඩුව භාරගන්නේ නැත. නමුත් ඇබෑර්තු ඇති වූ විට ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ. අපේක්ෂකයා තුන් අවුරුදු අස්ථිර පත්වීමක් ඇතුව ද, අපේක්ෂිකාව තුන් අවුරුදු පරීක්ෂණ කාල සීමාවක් ඇතුව ද පත් කෙරෙනු ඇත. සියළු අපේක්ෂක අපේක්ෂිකාවන් විසින්ම ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු ශාරීරික තත්ත්වයක් ඇද්දැයි සෙවීමේ වෛද්‍ය පරීක්ෂණයකින් සමාර්ථය ලැබිය යුතුයි. තව ද ඔවුන් ටයිප් ගසන්නන්ගේ සේවය පිළිබඳ කොන්දේසිවලට ද යටත් වනවා ඇත.

හ. එ. පීරිස්,
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

වර්ෂ 1960 ක් වූ අප්‍රේල් මස 27 වැනි දින,
කොළඹ, මහා භාණ්ඩාගාරයේ දී ය.

---

මගේ අංක ඊඩීඒ. 35/57 (II)
1960 අප්‍රියෙල් මස 27 වැනි දින කොළඹ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දී ය.

### ආරෝග්‍යශාලා ලිපිකරු සේවා විභාගය සැප්තැම්බර් 1959

1960 මාර්තු මස 25 වැනි දින නිකුත් කරන ලද අංක 12,092 දරන ගැසට් පත්‍රයෙහි පළවූ 1960 මාර්තු 16 වැනි දින දරන නිවේදනයට එක් කිරීම සඳහා පහත නම් සඳහන් අයදුම්කරුවන් 1960 සැප්තැම්බර් මස පැවැත්වූ ආරෝග්‍යශාලා ලිපිකරු සේවා විභාගයේ ප්‍රතිඵල අනුව ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ II වැනි පන්තියට පත්කිරීම සඳහා තෝරාගෙන ඇති බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | ලිපිනය |
|---|---|---|
| අබේකෝන් බණ්ඩා, එච්. ඇම්. | ... | තුම්පලහපුව, කරදගොල්ල. |
| අල්විස්, ඩබ්ලිව්. පී. | ... | 364, කෝන් ගහවත්ත, බොරලැස්ගමුව. |
| දනුසේකර, ඩබ්ලිව්. කේ. | ... | "විජිත" කටුකුරුන්ද, මොරටුව. |
| ඩික්සන්, ඇම්. කේ. | ... | නගරසභාව ගාල්ල. |
| ගුණතිලක, ඒ. ඇම්. | ... | ඊ. 38, ඇකිරිගල පාර, පිටිහුම, කෑගල්ල. |
| කනගරත්නම්, කේ. | ... | 14/2, ඔඩුමඩ වීදිය, යාපනය. |
| මිල්ලවිතානච්චි, ඇස්. | ... | දෙස්සෝව්ට වත්ත, නාගොඩ. |
| පෙරේරා, ජී. වී. | ... | 70/20, පන්සල්පාර, කොළඹ 10. |
| ප්‍රේමරත්න, ජී. | ... | දකුණු උඩුව, කුඩා උඩුව. |
| රූපසිංහ, ඇම්. ජී. ඩබ්ලිව්. | ... | අරව්වාවෙල, හිරිගේ ගම. |
| සුසෙසිදුසන්, ජී. ඇස්. | ... | අංක 6, අඩප්පන් පාර, යාපනය. |
| වාසල, සී. බී. | ... | අරම්පොල, මාවතගම. |

අයදුම්කරුවන්ට වහාම පත්වීම් දීමට ආණ්ඩුව බැඳී නැත. එහෙත් පුරප්පාඩු ඇතිවන අන්දමට පත්වීම් දෙනු ලැබේ. සෑම පත්වීමක්ම දෙනු ලබන්නේ තුන් වසක සෝදිසි කාලයකට ය. වෛද්‍ය පරීක්ෂණයකට මුහුණ දිය යුතු ඔවුහු ආරෝග්‍යශාලා ලිපිකරු සේවයේ කොන්දේසිවලට ද යටත් වන්නාහ.

සී. පොන්නම්බලම්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

---

## ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1), වානේ කබඩ් සැපයීම සඳහා 1960 මැයි මස 24 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙ අධිකාර තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලයා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළවිට 1960 මැයි මස 23 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

යූ. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1960 මැයි 6 වැනි දින,
කොළඹදීය.

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් තැපැල් ලිපිනය : 500 වැනි තැපැල් පෙට්ටිය, කොළඹ 1—කපු කාකි ඩ්‍රිල් සැපයීම සඳහා 1960 ජූලි 5 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාතීමේන්තුවේ අධිකාරි තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රුපියල් 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ, ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1960 ජූලි 4 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර පෝරම කොළ දෙනු ලැබේ.

විදෙශීය ටෙන්ඩර කරුවන් සඳහා විශෙෂ ටෙන්ඩර පෝරම සකස් කර තිබේ. රු. 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට බලය ලත් නියෝජිතයින්ට පමණක් එකී පෝරම කොළ දෙනු ලැබේ. ටෙන්ඩර කරුවන් විසින් තමන්ට වුවමනා කවර අන්දමේ ටෙන්ඩර පෝරම කොල ද යි සඳහන් කළ යුතුයි.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 මැයි 6 වැනිදා,
කොළඹ දී ය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මඩකලපුවේ නැගෙනහිර දිසාවේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ජූනි මස පළමු වැනි බදාදා පූර්ව භාග 9.30 දක්වා, ඒ ඒ වැඩ ගැන සඳහන් ගණන් වලට හෝ ඊට වැඩි ගණනකට මෙම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

1. රූගම් උප කොට්ඨාශයේ-වකාරේයි හි කණිෂ්ට කාර්මික නිලධාරි මහතකුගේ නිවාසයක් ගොඩනැගීම—(රු. 23,900)
2. රූගම් උප කොට්ඨාශයේ-වකනේරි හි තිවුන් කම්කරු නිවාස යක් ගොඩනැගීම සඳහා—(රු. 13,300)

1960 මැයි 31 වන අඟහරුවාදා දක්වා වෙන්කලාඩි හි රූගම් උප කොට්ඨාශයේ හි වාරිමාර්ග ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ටෙන්ඩර් පෝර්ම පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය. නැගෙනහිර කොට්ඨාශයේ ප්‍රාදේශීය ඉංජිනේරු තුමා විසින් 1960 ජූනි මස පළමු වැනිදා පූර්ව භාග 10ට ඔහුගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනවා ඇත. ටෙන්ඩර්කරුවන් රිසි නම් ඔවුනට විවෘත කරන වේලාවට පැමිණ සිටිය හැක.

ටෙන්ඩර් පෝර්ම දෙනු ලබන්නේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කළ බවට ඔප්පු කළහොත් මෙන් ම එක එක වැඩ සඳහා ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 25ක මුදල් පතක් හෝ ඒ මුදල කච්චේරියක තැන්පත් කළ බවට සැපයෙන රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් හෝ වෙන්කලාඩි හි වාරිමාර්ග ඉංජිනේරු තැන ගේ කාර්යාලයේ එම මුදල තැන්පත් කළ විටය.

ඇනටමත් රජයේ කොන්ත්‍රාත් කරන කොන්ත්‍රාත්කරුවන්, ඒ කාර්යය සතුටු දායක ලෙස කරන බවට, ලබාගත් සහතිකයක් ටෙන්ඩර් පත්‍ර ඉල්ලන විටදී ඉදිරිපත් කළ යුතුය.

වැඩි විස්තර වෙන්කලාඩි හි රූගම් උප කොට්ඨාශයේ වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත හැක.

සී. ජයසිං,
වාරිමාර්ග ඉංජිනේරු තැන රූගම් උප කොට්ඨාශය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමන් විසින් මාතලේ දිස්ත්‍රික්කයේ පිටිගහවත්ත වෙල්යාය අමුණ බැඳීම සඳහා ටෙන්ඩර් පත්‍ර ජූනි මස 1 වැනි බදාදා පෙරවරු 10 වනතෙක් එතුමාගේ කාර්යාල යේදී භාරගනු ලැබේ.

2. මේ සම්බන්ධව මනා පළ පුරුද්දක් ඇති වාරිමාර්ග දෙපාර්ත මේන්තුවේ රුපියල් 10,500කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි කළ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් 6.5.60 වෙනි දින සිට 28.5.60 වන තෙක් මාතලේ වාරිමාර්ග කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක මේ වෙනුවෙන් රු. 25 ක මුදලක් තැන්පත් කොට රිසිට්පතක් මාතලේ වාරිමාර්ග උපකොට්ඨාශ භාර ඉංජිනේරු තුමා වෙත ඉදිරි පත් කිරීමෙන් ටෙන්ඩර්පත්‍ර ලබාගත හැක.

3. දනට ආන්ඩුවේ කොන්ත්‍රාත් වැඩ කර ගෙනයන කොන්ත්‍රාත් කරුවන් ඔවුන්ගේ වැඩකටයුතු හොඳින් කරගෙන යන්නේයයි පැහැදිලි කිරීම පිණිස එම වැඩ භාර නිලධාරි තැනගෙන් සහතිකයක් ඉදිරිපත් කළයුතුයි.

4. මහනුවර මධ්‍යම දිසාවේ, ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1960 වේ ජූනි මස 1 වෙනි දින පෙරවරු 10.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කර ඇති කොන්ත්‍රාත් කරුවන්ට අවශ්‍යනම් එහි සිටිය හැක.

සී. තුරෙසිරාජසිංහම්,
මාතලේ උපකොට්ඨාශ භාර
වාරිමාර්ග ඉංජිනේරුතැන.

වාරිමාර්ග කාර්යාලය,
මාතලේ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල, ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් බදුලු ඔය ව්‍යාපාරයෙහි 6 වැනි සැතැපුමේ ජලයෙන් අලාභ වූ කොටස් අළුත්වැඩියා කිරීම සඳහා සීල් තබනලද ටෙන්ඩර්පත් 1960 මැයි මස 25 වෙනි බදාදා පෙරවරු 10 වනතෙක් මෙම දෙපාර්තමේන් තුවේ රුපියල් 25,000 හෝ ඊට වැඩි ගනණකට ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් පමණක් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් සමන්විත විය යුතුය. අවශ්‍ය පෝර්ම ආදිය බදුල්ල වාරිමාර්ග කායර්‍යාලයෙන් ලබාගත හැකි අතර ඒ සඳහා ඇති සැළසුම් හා අනිකුත් විස්තර එම කායර්‍යාලයේදී පරීක්ෂාකළ හැකිය.

3. මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන් බව ඔප්පු කළ හැකි හා රුපියල් 25 ක් කච්චේරියක හෝ බදුල්ල වාර්මාර්ග කායර්‍යාලයේ තැන්පත් කිරීමෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ අයවළුන්ට පමණක් 1960 මැයි මාසයේ 24 වැනි දින තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

ඇ. ජේ. ප්‍රි. පොන්රාජා,
බදුල්ල වාරිමාර්ග ඉංජිනේරු තැන.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1960 ජූනි මස 1 වැනි බුද දින පෙරවරු 9.30 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දදුරුඔය ව්‍යාපාරය යටතේ යාන්ත්‍රික ගේට්ටු තුනක් සැපයීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් ලබාගත් පෝර්ම පිටපත් දෙකක ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම පෝර්ම නිසි ලෙස පුරවා කොන්ත්‍රාත්කරුගේ අත්සන සහ දාතම යොදා සීල් තබන ලද කවරයක බහා එවිය යුතුය. මෙම ටෙන්ඩර් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමන් වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේනම් එතුමාගේ කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය.

3. කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලබන්නේ 1960 මැයි 31 වෙනි දින පස්වරු 3.00 දක්වා පමණි. මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 30,000 හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වී ඇති බව ඔප්පු කළ හැකි කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මෙම පෝර්ම ලබාගත හැක. මෙම පෝර්ම ලබා ගැනීමේදී රුපියල් 50ක මුදලක් තැන්පත් කොට ඒ සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය. මෙම මුදල කුරුණෑගල කච්චේරියේ හෝ කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තුමාගේ කාර්යාලයේ තැන් පත් කළ හැකිය.

ඇන්. ටී. කෝට්ටෙගොඩ,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
කුරුණෑගල උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
කුරුණෑගල.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මැද කොට්ඨාශය භාර අනුරාධපුරයේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත දැක්වෙන වැඩ සඳහා 1960 ජූනි මස 9 වෙනි බ්‍රහස්පතින්දා පෙරවරු 9.30 වන තෙක් ටැන්ඩර් භාර ගනු ලැබේ :—

එනම්, මහකනදරාව උප කොට්ඨාශය යටතේ—

(අ) මහකනදරාවේ ස්ථිර කම්කරු නිවාසයක් ගොඩනැගීම.

(ආ) නාච්චදූවේ ස්ථිර ඕවර්සියර් නිවාසයක් ගොඩනැගීම.

(ඉ) මහකනදරාව වැවේ දකුණු ඉවුරේ සොරොව්ව සෑදීම.

2. වෙන් වශයෙන් ඉදිරිපත් කළ යුතු මෙම ටැන්ඩර් සඳහා දෙපාතීමේන්තුවේ, පිළිවලින් 11,000ටත්, 16,000ටත් සහ රු. 18,000 ටත් හෝ වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් සුදුස්සන් වෙති.

3. සෑම ටැන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා ෆෝර්ම කොල සහ සියලු විස්තර මිහින්තලේ මහකනදරාව වාරිමාගී ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිය. 1960 මැයි 6 වෙනි සිකුරාද සිට 1960 මැයි 18 වෙනි බදාද දක්වා ෆෝර්ම කොල දෙනු ලැබේ.

4. ටැන්ඩර් කොල දෙනු ලබන්නේ කච්චේරියක හෝ මහකනදරාව වාරිමාගී කායශීලයෙහි එක සේවයකට රු. 25 බැගින් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කරණ දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ බවට සහතික පෙන්විය හැකි කොන්ත්‍රාත් කරුවනට පමණි.

5. දැනට රජයේ කොන්ත්‍රාත් වැඩ කරණ ටෙන්ඩර් කරුවන් ඒ වැඩ භාර නිලධාරීන්ගෙන් සතුටුදායක ලෙස වැඩ සිදුවන බවට සහතික ඉදිරිපත් කළ යුතුය.

6. ටැන්ඩර් භාර ගැනීම අවසන් කරන දින පෙරවරු 10.30 ට අනුරාධපුරය ප්‍රාදේශීය වාරිමාගී ඉන්ජිනේරු තුමා විසින් ටැන්ඩර් විවෘත කරනු බැලීමට ටැන්ඩර් කරුවනට පැමිණිය හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වාරිමාගී ඉන්ජිනේරු, මහකනදරාව, උ. කො.

මිහින්තලේ,
25. 4. 60.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර මධ්‍යම දිශාවේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් පහත සඳහන් වැඩ සඳහා මෙම දෙපාර්තමේන්තුවෙහි ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් 1960 ජූනි මස 1 වෙනි බදාද පෙරවරු 10 වන තෙක් භාරගනු ලැබේ :—

| වැඩ විස්තර | ලියා පදිංචි විය යුතු ගණන | තැන්පත් කළයුතු මුදල |
|---|---|---|
| නබඩගහ වත්ත වැව අලුත් වැඩියා කිරීම ... | 36,000/– හෝ ඊට වැඩි ... | 50/– |
| මැනික්දෙන වැව අලුත් වැඩියා කිරීම ... ... | 34,000/– හෝ ඊට වැඩි ... | 50/– |
| කන්දලම පාරට බොරලු සැප යීම සහ ඇකිරීම ... | 7,500/– හෝ ඊට වැඩි ... | 25/– |

තැන්පත් කළයුතු මුදල නාලන්ද වාරිමාර්ග කායශීලයෙහි තැන්පත් කොට හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කොට රිසිට් පතක් ඉදිරිපත් කිරීමෙන් 1960. 5. 9. දින සිට 1960. 5. 31 දින දක්වා ටෙන්ඩර් පත්‍ර නාලන්ද වාරිමාර්ග කායශීලයෙන් ලබාගත හැක.

දැනට ආණ්ඩුවේ කොන්ත්‍රාත් වැඩ කරගෙන යන කොන්ත්‍රාත් කරුවන් ඔවුන්ගේ වැඩවල තත්ත්වය පිළිබඳ සහතිකයක් එම වැඩ භාර නිලධාරි තැනගෙන් ඉදිරිපත් කළ යුතුයි.

මහනුවර මධ්‍යම දිසාවේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් 1960 ජූනි මස 1 වෙනි බදාද පෙරවරු 10.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් විවෘත කරන වේලාවට යම්කිසි කොන්ත්‍රාත් කරුවෙකුට උවමනා නම් එහි සිටිය හැක.

වැඩි විස්තර සඳහා නාලන්ද උප කොට්ඨාශය භාර නිලධාරි තැන ගෙන් විමසන්න.

උප කොට්ඨාශ භාර නිලධාරි තැන,
නාලන්ද

1960 අප්‍රේල් මස 26 වෙනි දින,
වාරිමාගී කායශීලය,
නාලන්ද.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි උපකරණ සැපයීම

කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්‍ෂ 1960 ජූලි මස 26 වැනි අඟහරුවාද උදේ 10 වන තෙක් (1) ඇලුමිනියම් ඇලෝයි පීලි තහඩු, (2) ඇලුමිනියම් ඇලොයි රිජින්ග්ස් සහ (3) f ප්‍රි පැබ්රිකේටඩ් ; ස්ලොටඩ් ඇන්ගල්ස් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් අයදුම් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර් අයැදුම්කරුවනට ඒ ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ඇත.

කොළඹ, බුලර්ස් පාරේ පිහිටි වාරිමාර්ග අධ්‍යක්‍ෂ තැනගේ කාර්යාල යෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් අයැදුම් පත් ලියා අනු පිටපතක්ද සමග එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 250ක් කොළඹ මහ ලේකම් කාර්යාලයේ වාරිමාර්ග අධ්‍යක්‍ෂ තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ලබාගෙන එහි ඉදිරිපත් කළ විට වර්‍ෂ 1960 ජූලි මස 22වෙනි සිකුරාද වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර කොළඹ බුලර්ස් පාරේ පිහිටි වාරිමාර්ග අධ්‍යක්‍ෂ තුමාගේ කාර්යාලයෙන් ලබාගත හැක.

බා. සෙල්ලහේවා,
වාරිමාර්ග අධ්‍යක්‍ෂ වෙනුවට.

වර්‍ෂ 1960ක්වූ අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේදීය.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ පළාතේ ප්‍රාදේශීය වාරිමාගී ඉංජිනේරු තැන විසින් නිකවැරටිය උප කොට්ඨාශයේ ගල්ගමුවේ නිදන ශාලාවක් ඉදිකිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 15,000කට හෝ ඊට වැඩි යෙන් ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් 1960 මැයි මස 18 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර හා මේ පිළිබඳ වැඩි විස්තර නිකවැරටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් 1960 මැයි මස 16 වෙනි සඳුද පස්වරු 4.30 දක්වා ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරුවන් විසින් නිකවැරටිය වාරි මාර්ග කාර්යාලයේ හෝ කච්චේරියක මෙම වැඩය සඳහා රුපියල් 25ක මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

ආර්. බී. ඇම්. ප්‍රනාන්දු,
නිකවැරටිය උප කොට්ඨාශය භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය,
නිකවැරටිය, 1960. 4. 28.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු දිශාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග තුමා විසින් වවුනියා උප කොට්ඨාශයේ උඩයාර්කුලමේ සොරොව්ව සහ වාන තැනීම සඳහා 1960 මැයි මස 24 වනදා උදේ 9.30 දක්වා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 10,000කට හෝ ඊට වැඩියෙන් ලියාපදිංචි වී ඇති, සහ සටහන් පොත් ඉදිරිපත් කළ හැකි කොන්ත්‍රාත්කරුවන් ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. වවුනියාවේ වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පිළියෙළ කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින්, මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. වැඩ පිළිබඳ විස්තර වවුනියාවේ වාරිමාර්ග ඉංජිනේරුතුමාගෙන් කාර්යාල වේලාවල දී ලබාගත හැක. එවන සියලුම ටෙන්ඩර් පත්‍රවල කවරයේ වම් කෙළවරේ " උඩයත්කුලම් වැඩ " යනුවෙන් සඳහන් විය යුතුයි.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති, රුපියල් 25ක් කච්චේරියේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවනට, 1960ක්වූ මැයි මස 23 වනදා දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. වුවමනා කරන සිමෙන්ති, සිමෙන්ති පයිප්ප, පයිප්ප කරවල් සහ සොරොව් ගේට්ටුව පමණක් වැඩ පොළ අසල ගබඩාවෙහි සපයනු ඇත. අන් කිසිම ද්‍රව්‍යයක් හෝ ආයුධයක් වැඩය සඳහා සපයනු නොලැබේ.

5. 1960ක්වූ මැයි මස 24 වනදා පෙරවරු 9.30ට උතුරු කොට්ඨාශ භාර වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත

කරනු ලැබේ. 1960 මාර්තු මස 24 වනදා සිට සති හයක් යන තෙක් සියලුම ටෙන්ඩර් පත්‍ර සැලකිල්ලට භාජන වන බැව් සැලකිය යුතුයි.

වී. බාලසුබ්‍රමානියම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
වවුනියාව.

1960 අප්‍රේල් 27 වන දින,
වවුනියාව.

---

## අලෙවි කිරීමේ සංවර්ධන දෙපාර්තමේන්තුව

### බොරැල්ලේ පිහිටි බේකරියට 1960.12.31 දින දක්වා 'මාජරින්' සැපයීම

අලෙවි කිරීමේ සංවර්ධන දෙපාර්තමේන්තුවට අයිති, බොරැල්ලේ මැගසින් පාරේ පිහිටි බේකරියට 1960.12.31 දින දක්වා කාලයට 'මාජරින්' සැපයීම පිණිස ටෙන්ඩර් ඉල්ලුම් පත්, 1960 මැයි මස 27 වැනි සිකුරාද අ. භා. 2.30 වන තෙක්, කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62, දරණ ස්ථානයේ පිහිටි කාර්යාලයේ අලෙවි කිරීමේ කොමසාරිස් වරයා විසින්, භාරගනු ලැබේ. තුන්මසකට මාජරින් රාත්තල් 28 වේ ටින් 8ක් පමණ වුවමනා වේ.

ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගැනීම සඳහා, කොළඹ කොටුවේ, චැතැම් වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ සංවර්ධන කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 25ක් බැඳ කුවිතාන්සියක් අලෙවි කිරීමේ සංවර්ධන කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ඉල්ලුම් පත් 1960.5.27 වැනි සිකුරාද දවල් 12 වන තෙක් නිකුත් කරනු ලැබේ.

අ. වි. ර. පෙරේරා,
අලෙවි කිරීමේ සංවර්ධන කොමසාරිස් තැන වෙනුවට.

චැතැම් වීදියේ අංක 62, දරණ ස්ථානය,
කොළඹ 1,
1960 අප්‍රේල් මස 22 වැනි දින දිය.

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ තිබෙන ත්‍රිපොලි වෙළඳ සැලට 1960.6.1 සිට 1960.6.30 දක්වා ඇති කාලය තුළදී අළුත් බිත්තර සැපයීම පිණිස ටෙන්ඩර් 1960 මැයි මස 16 වැනි සඳුද අපරභාග 2.30 වන තෙක් කොළඹ යූනියන් ප්ලේස්හි පිහිටි ආහාර වාණිජ හා වෙළඳ අමාත්‍ය කාර්යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් භාරගනු ලැබේ.

කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් 1960.5.16 වැනි දින දවල් 12 වනතුරු ලබාගතහැකි ඒ සඳහා අවශ්‍ය ටෙන්ඩර් පෝරමවල ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි.

වැඩි විස්තර කොළඹ කොටුවේ චැතැම් වීදියේ අංක 62 දරන ස්ථානයේ පිහිටි අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවෙන් දැනගතහැක.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවිකිරීමේ කොමසාරිස්තුමා වෙනුවට.

1960.4.28වැනි දින,
කොළඹ—1, චැතැම් වීදියේ
අංක 62 දරන ස්ථානයේ පිහිටි
අලෙවිකිරීමේ දෙපාර්තමේන්තුවේදී යැ.

---

## ආහාර දෙපාර්තමේන්තුව

### අබලන් හිස් ගෝනි විකිණීම

කොළඹ චාර්මර්ස් ධාන්‍යාගාරයේ තිබෙන අබලන් හිස් ගෝනි 46,000 ක් පමණ විකිණීම සඳහා ටෙන්ඩර් පත් 1960 මැයි මස 24 වැනි අඟහරුවාද පස්වරු 2.30 වනතෙක් ආහාර කොමසාරිස් විසින් භාරගනු ලැබේ.

ඉල්ලුම් කළවිට මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම් කොළවල ටෙන්ඩර් පත් පිළියෙල කළ යුතුයි. ටෙන්ඩරය පිළිබඳව විස්තර වාර්තාවක් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කළ විට ලබාගත හැකිවේ.

කේ. ඇම්. ඩී. ජයනෙත්ති,
ආහාර කොමසාරිස්.

1960 මැයි 2 දා,
කොළඹ, 330, යූනියන් පෙදෙසේදී ය.

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### (නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 දරණ ස්ථානයේ පිහිටා තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් කෑගල්ල දිස්ත්‍රික්කයේ පරගම්මන පිහිටි නියමිත මිල යෝජනා ක්‍රමයේ වී ගබඩාවට 1960 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා කම්කරු හා ප්‍රවාහන සේවා සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත් 1960 මැයි මස 27 වෙනි සිකුරාද අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. කෑගල්ල කච්චේරියට රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් එහි නියෝජ්‍ය ආහාර පාලකතුමාට ඉදිරිපත් කර 1960 මැයි මස 26 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12 වනාතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ලබාගෙන අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර කෑගල්ලේ නියෝජ්‍ය ආහාර පාලක තුමාගෙන් හෝ සහකාර ගොවිජන සේවා කොමසාරිස් තුමාගෙන් ලබාගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙනුවට.
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම).

1960.5.6,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10.

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### (නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42 දරණ ස්ථානයේ පිහිටා තිබෙන ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් මහනුවර දිස්ත්‍රික්කයේ කුන්ඩසාලේ පිහිටි නියමිත මිල යෝජනා ක්‍රමයේ අලුත් වී ගබඩාවට 1960 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා කම්කරු හා ප්‍රවාහන සේවා සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් ඉල්ලුම් පත් 1960 මැයි මස 27 වෙනි සිකුරාද අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ.

2. මහනුවර කච්චේරියට රු. 50 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් එහි නියෝජ්‍ය ආහාර පාලකතුමාට ඉදිරිපත් කර 1960 මැයි මස 26 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත් ලබාගෙන අනුපිටපතක් ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර මහනුවර නියෝජ්‍ය ආහාර පාලක තුමාගෙන් හෝ සහකාර ගොවිජන සේවා කොමසාරිස් තුමාගෙන් ලබාගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙනුවට.
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

1960.5.6
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
336, ඩීන්ස් පාර, කොළඹ 10.

සඳහා රජයේ හෝ කොළඹ නගර සභාවේ ලියා පදිංචි වී සිටින කොන්ත්‍රාත් කරුවනට, ටෙන්ඩරය සඳහා ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් කොළඹ නම් ලංකා බැන්කුවේත්, කොළඹින් පිටත නම් කච්චේරියකින් රුපියල් 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් අනතුරුවය.

3. සැලසුම්, විස්තර විභාග, ගිවිසුම් සහ අවශ්‍ය අනෙක් තොරතුරු ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමාගෙන් ලබාගන්නටත් වැඩය අරඹන ස්ථානය පරීක්ෂා කර බැලීමටත් අයදුම් කරුවනට නිවේදනය කෙරේ.

4. කොන්ත්‍රාත්තුව අත්සන් තැබීමට පෙරාතුව තෝරාගත් අයදුම් කරු විසින් ටෙන්ඩර් කරන ලද මුළු වටිනාකමෙන් 5% ක් වැඩි නොවන මුදලක් කොන්ත්‍රාත්තුව අවංක ලෙස සම්පූර්ණ කිරීමට බැඳීමක් වශයෙන් ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු තුමා නමින් ලංකා බැංකුවේ තැන්පත් කළ යුතු වෙයි.

5. ටෙන්ඩර් පත්, කොළඹ ගාලු මුවදොර පිහිටි මහලේකම් ගොඩ නැගිල්ලේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වැඩ අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගේ කාර්යාලයේ අංක 159 දරණ කුටියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කරන්න. නැතහොත් රෙජිස්ටර් තැපෑලෙන් යවන්න. අයදුම්කරුවන් ඔවුන්ගේ ටෙන්ඩර් රෙජිස්ටර් තැපෑලෙන් යවන්නට අකමැත්තෙහි නම් මුද්‍රා තබන ලද කවරයේ පිට පැත්තේ වැඩය සහ අයදුම්කරුගේ නමත් ලිපිනයත් සඳහන් කර ඉහත සඳහන් ස්ථානයේදී මේ ටෙන්ඩර් ඉල්ලීම් භාර ගැනුමට බලය දී තිබෙන නිලධාරිතුමාට භාර දීය යුතු වෙයි. මුද්‍රා සහිත ටෙන්ඩර් ඉල්ලීම් භාරගත් බවට ඔහු විසින් කුවිතාන්සියක් නිකුත් කරනවා ඇත.

6. ඉහත සඳහන් පළමුවැනි ඡේදයේ ප්‍රකාර ටෙන්ඩර් භාර ගැනීම නවතාලූ දින පටන් පුරා තෙමසක් තුළ ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් වලංගු ලෙස සලකනු ලැබේ.

7. පළමුවැනි ඡේදයේ සඳහන් ස්ථානයේදී ඒ නියමිත දින එකී වේලාවට කෙරෙන ටෙන්ඩර් විවෘත කිරීමේ දී හැම ඉල්ලුම් කරුවෙකුටම පෙනී සිටීමට අවසර ලැබෙනවා ඇත.

වී. ජේ. එම්මැනුවල්,
ප්‍රධාන සෞඛ්‍ය ඉංජිනේරු.

ටොරින්ටන් චතුරශ්‍රය,
තැ. පෙ. 1434,
කොළඹ 7,
1960 මැයි 2 වන දිනදීය.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

### හැඳල, හේකිත්ත 1 ඩබ්ලිව් වගීයේ ගෙවල් 49ක් සහ ළිං 4ක් තැනීම

හැඳල හේකිත්ත නම් ගමෙහි 1 ඩබ්ලිව් වගීයේ ගෙවල් 49ක් සහ ළිං 4ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 ජූනි මස 3 වෙනි සිකුරාද පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිඛ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 2,00,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියා පදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 200ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 ජූනි මස 1 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

රේ. ලෝ. ආර්නෝල්ඩ්,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1960 අප්‍රේල් මස 28 වැනි දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2.

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### මාර්ග දෙකකින් යුත් කොන්ක්‍රීට් නළ 36,000ක් සැපයීම

මසකට 3,000 බැගින් මාර්ග දෙකකින් යුත් නළ 36,000ක් සැපයීම සඳහා 1960 ජූනි මස 7 වෙනි දින පෙ. ව. 9.30 දක්වා කොළඹ තැපැල්, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

කොළඹ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ටැලිග්‍රාප් කැෂියර් වෙත හෝ පිට පළාත්වල නම් තැපැල් ස්ථානාධිපති වෙත හෝ රු. 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කර කොළඹ, මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි පෝරමවල ටැන්ඩර් පත්‍ර (අනුපිටපතක් සහිතව) ඉදිරිපත් කළ යුතුයි.

1960 ජූනි මස 6 වෙනි දින ප. ව. 4 දක්වා ටැන්ඩර් පිළිබඳ ලිය කියවිලි නිකුත් කරනු ලැබේ.

කොන්ත්‍රාත්තුව මැනවින් ඉටු කිරීම සඳහා පොරොන්දු පත්‍රයකට අත්සන් ගැනීමට ඇපකරුවන් දෙදෙනකු තම වියදමින් ඉදිරිපත් කරන ලෙස අවශ්‍ය වුවහොත් තෝරාගත් ටැන්ඩර්කරුට නියම කරනු ලැබේ.

කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීමේ පොරොන්දුවක් වශයෙන් ටැන්ඩරයේ වටිනාකමින් සියයට 5කට සමාන වන මුදලක් පෝස්ට් මාස්ටර් ජනරාල් වෙත තැන්පත් කරන ලෙස තෝරාගත් ටැන්ඩර් කරුට නියම කරනු ලැබේ. තවද, කොන්ත්‍රාත්තුවට බැඳෙන විට මුද්දර ආඥාපනත යටතේ එම ගිවිසුම් පත්‍රයට මුද්දර ගැසීමටද ටැන්ඩර්කරු බැඳී සිටී.

මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන සියලුම ටැන්ඩර් පත්‍ර ඒවා බාරගනු ලැබූ අවසාන දින සිට අඩු ගණනේ දින හැටක් (60) වලංගුව තිබිය යුතුයි.

1960 ජූනි මස 7 වෙනි දින පෙ. ව. 10ට කොළඹ තැපැල්, ගුවන් විදුලි හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටැන්ඩර් පත්‍ර විවෘත කරන විට ටැන්ඩර් කරුවන්වද එහි පැමිණ සිටිය හැක.

එච්. ඊ. සෙනෙවිරත්න,
පෝස්ට්මාස්ටර් ජනරාල්.

ප්‍රධාන තැපැල් කාර්යාලය,
කොළඹ, 1960.4.29.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

### විකුණුම් දැන්වීමයි

පහත සඳහන් දේ මිලට ගැනීම සඳහා සීල්කොට එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5 කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනා ගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960වෙ මැයි මස 13 වෙනිදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ :—

| | ගොඩවල් |
|---|---|
| 1. 700 × 20 සිට 1000 × 20 ප්‍රමාණවල අබලන් ටයර 300 | 23 |
| 2. අබලන් ටියුබ් හා ප්ලැප්ස් ... ... | 1 |
| 3. හිස් ග්‍රීස් ටින් හා තෙල් ටින් ... ... | 1 |
| 4. (කඩා බිඳු දැමූ බස්වල) ලී, බෙලෙක් සහ යකඩ වැඩකෑලි | 4 |
| 5. හිස් ඇහුරුම් පෙට්ටි හා දර ... ... | 1 |
| 6. ගැලුම් 45හේ පිළිස්සුන තෙල් පීප්ප (පීප්ප 200) ... | 1 |
| 7. අබලන් මෝටර් අමතර වැඩ කෑලි ... ... | 6 |
| 8. අබලන් බැටරි (3,600) ... ... | 1 |
| 9. ගැලුම් 45හේ හිස් පීප්ප (ගොඩකට 800කි) ... | 2 |

සියලු ගොඩවලට අඬක යොදනු ලැබේ. ඉල්ලුම් කරුවන් ඒ අඬක සඳහන් කළ යුතුයි.

තැබිය යුතු තැන්පත් මුදල් මෙසේ ය :—

1, 7, 8, 9, යන මේ දේවලින් එකකට රු. 500 බැගිනි.

2, 3, 4, 5 යන මේ දේවලින් එකකට රු. 100 බැගිනි.

6 වෙනි දේට රු. 300 කි.

කොළඹ 5 කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි මහතා වෙත මුදල් තැන්පත් කොට ඒ සඳහා ලැබෙන කුවිතාන්සිය ටෙන්ඩර ප්‍රත්‍රයට ඇමිණිය යුතුයි. මේ තැන්පත් මුදල් ආපසු ලබාගත හැකිය. ටෙන්ඩර පත්‍රය එවන කවරයේ වම්පැත්තේ උඩු කෙළවරෙහි "අබලන් බඩු සඳහා එවන ටෙන්ඩර පත්‍රය" යන මේ පාඨය පැහැදිලි ලෙස ලිවිය යුතුයි. තෝරා ගනු ලබන ටෙන්ඩරකාරයා විසින් තමා තෝරාගත් බවට නිවේදනය ලැබී සත් දවසක් ඇතුළතදී සම්පූර්ණ මුදල ගෙවා ද්‍රව්‍ය හැරගෙන යායුතුයි. මේ කාලය ඇතුළත බඩු හැරගෙන නොගිය හොත් බඩුවලට විය හැකි අලාභහානි ගැන මණ්ඩලය වග නොකියන්නේ ය.

බොරලැස්ගමුවේ වේරහැර ලංකා ගමනාගමන මණ්ඩලීය සම්පාදක කොට්ඨාස භූමියේදී යටකී බඩු පරීක්ෂාකර බැලිය හැකිය.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
ලේකම් තැන.

1960 අප්‍රියෙල් මස 29 වෙනි දින කොළඹදීය.

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### තෙල්දෙණිය ජල සම්පාදන යෝජනා ක්‍රමය

මහනුවර දිස්ත්‍රික්කයේ තෙල්දෙණිය නගරයට නළ මගින් ජලය සැපයීමේ 2 වැනි කොටස තැනීම සඳහා කොළඹ, මහලේකම් කාර්යාලයේ, පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1960වේ ජූනි මස 2 වැනි දින පෙරවරු 10 දක්වා පිටපත් දෙකකින් යුක්ත වූ මුද්‍රිත ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර මෙයින් භාර ගනු ලැබේ.

2. කොළඹ, පරණ මහා ලේකම් කාර්යාලයේ අංක 267 දරණ කාමරයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ (සතියේ දිනවල පෙරවරු 9 යේ සිට පස්වරු 4 දක්වාත් සෙනසුරාදා දිනවල පෙරවරු 9යේ සිට පෙරවරු 10 දක්වාත් වූ කාල සීමාවල් ඇතුළතදී) රුපියල් 50ක මුදලක් තැන්පත් කොට ඒ සඳහා ලබා ගත යුතු කුවිතාන්සියක් ඉදිරිපත් කොට කොළඹ පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබා ගත් ආකෘති පත්‍ර වලින් ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

3. ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල ජල කර්මාන්ත පිහිටුවීමේ හා කාණු සැපයීමේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් හෝ කොළඹ නාගරික සභාවේ රුපියල් 50,000කට වඩා තක්සේරු කර ඇති කර්මාන්ත සම්බන්ධයෙන් හෝ ලියාපදිංචි වූවන්ට 1960 මැයි මස 28 වැනි සෙනසුරාදා පෙරවරු 10 දක්වා යථොක්ත ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබනු ඇත. මෙරට කොන්ත්‍රාත්කරුවන් විසින් ලියාපදිංචි කළ කවරයක බහා ස්වකීය ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමට අදහස් කරනු නොලැබෙතොත් එම කවරයේ පිට පැත්තේ විශේෂ කර්මාන්තයත්, ස්වකීය නම, ගම සහ ලියුම් ලැබෙන පිළිවෙලත් සඳහන් කොට ඔවුන් විසින් හෝ ඔවුන්ගේ නියෝජිතයන් විසින් හෝ, එම ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර භාර ගැනීමට අවසර දී ඇති, කොළඹ, මහා ලේකම් කාර්යාලයේ අංක 264 දරණ කාමරයේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පළාත් පාලන සහකාර කොමසාරිස්වරයා වෙත ස්වකීය මුද්‍රිත ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර පෞද්ගලිකව පැමිණ භාර දිය යුතුය.

4. ටෙන්ඩර් ඉල්ලුම්කරුවන් විසින් ස්වකීය ඉල්ලීම්, ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට මාස හයක කාල සීමාවක් එසේම තබා ගත යුතුය.

5. මෙම ටෙන්ඩර ඉල්ලුම් පත්‍ර විවෘත කරන දිනය වන 1960වේ ජූනි මස 2 වැනි දින පෙරවරු 10ට ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ට කොළඹ, මහා ලේකම් කාර්යාලයේ අංක 264 දරණ කාමරයට පැමිණිය හැකිය. මෙම ටෙන්ඩර ඉල්ලුම් පත්‍රය සම්බන්ධයෙන් කළ යුතු වැඩ කටයුතු හා ඒ පිළිබඳ විස්තර තොරතුරු ආණ්ඩුවේ නිවාඩු දවස් හැර සතියේ සියලුම දවස්වල පෙරවරු 9යේ සිට පස්වරු 4.30 දක්වාත්, සෙනසුරාදා දිනවල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාත් පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජල කර්මාන්ත ඉංජිනේරුවරයාගෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිය.

වී. සී. ජයසූරිය,
පළාත් පාලන කොමසාරිස්.

වර්ෂ 1960 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ, පළාත් පාලන කාර්යාලයේදී ය.

---

## මැතිවරණ දෙපාර්තමේන්තුව

### සීවී. 1262 දරණ කොමර් බස් එක සහ සීවී. 1367 දරණ ෆෝඩ් වී-8 ලොරිය මිලයට ගැනීම

සීවී. 1262 දරණ කොමර් බස් එක සහ සීවී. 1367 දරණ ෆෝඩ් වී-8 ලොරිය මිලයට ගැනීම සඳහා ගණන් නියම කෙරෙන ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ. එකී ටෙන්ඩර් පත්‍ර 1960 මැයි 30 වැනි දින පෙරවරු 9.30 දක්වා මැතිවරණ කොමසාරිස්තැන විසින් භාර ගන්නවා ඇත. කාර්යාල වේලාවන්හීදී මැතිවරණ කොමසාරිස් කාර්යාලයේදී එකී වාහන පරීක්ෂාකර බැලීමට පුළුවන.

2. ටෙන්ඩර් පත්‍රය කවරයක දමා මුද්‍රා තබා කවරයේ වම් අත පැත්තේ ඉහල කොනේ "**දෙපාර්තමේන්තුමය වාහන මිලයට ගැනීම සඳහා ටෙන්ඩර් පත්‍රය**" යන්න ලියා, මැතිවරණ කොමසාරිස්, අංක 31, ගිල්ෆර්ඩ් ක්‍රෙසන්තය, කොළඹ 7 යන ලිපිනයට එවිය යුතුය.

3. තැපැලෙන් එවනු ලබන ටෙන්ඩර් පත්‍ර රෙජිස්ට්‍රර් තැපැලෙන් එවිය යුතුය. පුද්ගලිකව පැමිණ භාරදෙන ටෙන්ඩර් පත්‍ර ටෙන්ඩර් ඉල්ලුම්කරු විසින් හෝ ඔහුගේ ඒජන්ත තැන විසින් රැගෙන විත්, මෙම දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාර තැනට භාරදී කුවිතාන්සියක් ලබා ගත යුතුය. ඉහත කී 1 වැනි අනුච්ඡේදයේ නියමකර ඇති දින සහ වේලාවට කලින් ටෙන්ඩර් පත්‍රය භාර දිය යුතුවේ.

4. ටෙන්ඩර් ඉල්ලුම්කරු විසින් සකස් කරගත් ෆෝර්මවල ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතු වන අතර ඒවා පිටපත් දෙකකින් යුක්ත කොට එවිය යුතුය. ටෙන්ඩර් පත්‍රයේ කෙරෙන යම්කිසි වෙනස් කිරීමක් හෝ මැකීමක් හෝ වේනම් ඒවා එසේ කළ බවට ටෙන්ඩර් ඉල්ලුම්කරු විසින් කෙටි අත්සන තබා සහිර කළ යුතුවේ. මීළඟ අනුච්ඡේදයේ සඳහන් ටෙන්ඩර් ඇප මුදල තැන්පත් කොට ලබා ගන්නා ලද කුවිතාන්සිය ටෙන්ඩර් පත්‍රයට ඇමිනිය යුතුය.

5. මුදලින් රුපියල් 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මැතිවරණ කොමසාරිස් කාර්යාලයේ තැන්පත් කළ යුතුය. මෙම මුදලට ලබා ගන්නා ලද කුවිතාන්සිය ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රයට ඇමිනිය යුතුය.

6. ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරනු ලැබුවාට පසු ඒවා නැවත ඉල්වා අස්කර ගැනීමට ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ට ඉඩදෙනු නොලැබේ.

7. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ ටෙන්ඩර් පත්‍ර සියල්ලම කිසිම ප්‍රශ්ණයක් නොමැතිව ප්‍රතික්ෂේප කිරීමේ බලය ආණ්ඩුව සතුවෙනවා ඇත. මෙම දැන්වීමේ සඳහන් කොන්දේසි සියල්ලම නිසි ලෙස පිළිපදිනු නොලැබුවාවූ ටෙන්ඩර් පත්‍ර ගැන සලකා බලනු නොලැබේ.

8. 1960 මැයි 30 වැනි දින පෙරවරු 9.35 ට කොළඹ 7, ගිල්ෆර්ඩ් ක්‍රෙසන්තයේ අංක 31 දරණ ස්ථානයේ පිහිටි මැතිවරණ කොමසාරිස් කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ට පැමිණ සිටීමට අවසර ඇත.

9. තෝරාගනු ලැබූ ටෙන්ඩර් ඉල්ලුම්කරු විසින් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දැනුම් දෙන ලියමන ලැබූ දින සිට සතියක් ඇතුළත, ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කර ඇති මුළු මුදලම ගෙවීමට සූදානම් වී සිටිය යුතුයි. එසේ මුදල් ගෙවනු නොලැබුවහොත් ඔහුගේ ටෙන්ඩර් පත්‍රය අවලංගු වී ටෙන්ඩර් තැන්පත් මුදල ආණ්ඩුව සන්තක වෙනවා ඇත. මුදල් ගෙවා අවසන්වූ හැටියේම වාහනය රැගෙන යා යුතුය.

10. මෙහි පහත අත්සන් කරන අයගේ කාර්යාලයෙන් වැඩිපුර තොරතුරු ලබා ගත හැක.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස්.

1960 අප්‍රේල් 25 වැනි දින,
31, ගිල්ෆර්ඩ් ක්‍රෙසන්තය,
කොළඹ 7.

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### අරක්කු බෝතල්වල පිරවීම සඳහා ටැන්ඩර්

පහත සඳහන් වන සුරාබදු ගුදම් වලින් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ සඳහා, එක් අවුරුදු කාලයක් තුල, අරක්කු බෝතල් වල පිරවීම සඳහා ටැන්ඩර්, කම්කරු, කර්මාන්ත හා ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින්, වර්ෂ 1960 මැයි මස 25 වැනි බදාදා දවල් 12 දක්වා භාරගනු ලැබේ:—

| | |
|---|---|
| මඩකලපුව<br>බදුල්ල | 1960 ජූලි මස 1 වැනි දින පටන්. |
| කළුතර<br>මහනුවර<br>යාපනය | 1960 අගෝස්තු මස 1 වැනි දින පටන්. |
| මීගමුව<br>ත්‍රිකුණාමලය | 1960 සැප්තැම්බර් මස 1 වැනි දින පටන්. |

2. මේ පිළිබඳ සියළුම විස්තර ඉල්ලුම් කළ විට එවනු ලබන තැනැත්තා වන, සුරාබදු කොමසාරිස් තැනගෙන් ලබාගත් ෆෝර්ම කොළවල ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුය.

ඊ. බී. වඩුගොඩපිටිය,
සුරාබදු කොමසාරිස් තැන.

1960 අප්‍රේල් 30 වැනි දින, කොළඹ—6,
වැල්ලවත්තේ සැවෝයි ගොඩනැගිල්ලේ පිහිටි
සුරාබදු කොමසාරිස් තැනගේ කාර්යාලයේදීය.

---

## ලුණු දෙපාර්තමේන්තුව

### පොල් අතු සැපයීම

වර්ෂ 1960 ජූලි මස 1 වැනි දින සිට 1961 ජූනි 30 වැනි දින දක්වා පුත්තලම සහ පාලාවි ලුණු ලේවාවලට පොල් අතු (ඉරු දෙකේ) 1,50,000ක් පමණ සැපයීම සහ ගෙනත් භාරදීම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ කොම්පඤ්ඤ වීදියේ ජේනරල්ස් ලේක් පාරේ නො. 110, තැ. පෙ. 539 දරණ ලුණු කොමසාරිස් තැන විසින් 1960 මැයි මස 27 වැනි සිකුරාදා පස්වරු 3 වන තුරු භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ පුත්තලමේ ආණ්ඩුවේ දිසාපති තැනගේ හෝ පුත්තලමේ සහ පාලාවියේ ලුණු අධිකාරි වරුන්ගෙන් ලබා ගන්නා ෆෝර්ම කොළවලය. ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන්

රු. 25ක් ඔනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටැන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස්.

අංකය : ටී. ජී. 191.
1960 මැයි මස 6 වැනි දින,
කොළඹ.

---

## ලුණු දෙපාර්තමේන්තුව

### පොල් අතු සැපයීම

වර්ෂ 1960 ජූලි මස 1 වැනි දින සිට 1961 ජූනි මස 30 වැනි දින දක්වා නිලාවෙලි සහ මන්නාරම ලුණු ලේවාවලට පොල් අතු (ඉරු දෙකේ) 40,000 පමණ සැපයීම සහ ගෙනත් භාරදීම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ කොම්පඤ්ඤ වීදියේ ජෙනරල්ස් ලේක් පාරේ නො. 110, තැ. පෙ. නො. 539 දරණ ලුණු කොමසාරිස් තැන විසින් 1960 මැයි මස 27 වැනි සිකුරාද පස්වරු 3 වන තුරු භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනුපිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ එම කී ලුණු ලේවා කොට්ඨාශවලට අයත් ආණ්ඩුවේ දිසාපති වරුන්ගෙන් හෝ එම කී ලුණු ලේවා භාරකාර නිලධාරීන්ගෙන් ලබාගන්නා පෝර්ම කොළවලය. ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 25ක් ඔනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටැන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස්.

අංකය : ටී. ජී. 139.
1960 මැයි මස 6 වැනි දින,
කොළඹ.

---

## ලුණු දෙපාර්තමේන්තුව

### පොල් අතු සැපයීම

වර්ෂ 1960 ජූලි මස 1 වැනි දින සිට 1961 ජූනි 30 වැනි දින දක්වා ඇලිෆන්ට් පාස් ලුණු ලේවායට පොල් අතු (ඉරු දෙකේ) 3,00,000ක් පමණ සැපයීම සහ ගෙනත් භාරදීම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ නව මහා ලේකම් ගොඩනැගිල්ලේ තැ. පෙ. නො. 570 දරණ කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 ජූනි මස 1 වැනි බදාදා දවල් 12 වන තුරු භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනුපිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ යාපනේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් හෝ ඇලිෆන්ට් පාස් ලුණු අධිකාරි තැනගෙන් ලබාගන්නා පෝර්ම කොළවලය. ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් ඔනෑම කච්චේරියක බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටැන්ඩර් පෝර්ම කොළ දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස්.

අංකය : ටී. ජී. 8.
1960 මැයි මස 6 වැනි දින,
කොළඹ.

---

අංකය : අයි/පී. කේ. ඇස්/499/5.

## පුත්තලම් දිස්ත්‍රික්කයේ සුලු වාරිකම් වැඩ

පහත දක්වන සුලු වාරිකම් වැඩ සඳහා මෙම කච්චේරියෙන් ලබා ගන්නා ලද ආකෘතිපත්‍රවල එවන ගණන් යෝජනා පත්‍ර 1960 මැයි මස 18 වැනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ :—

1. යක්දෙස්සාව මීගහවෙල බැම්මේ රෙගුලේටරයක් ඉදිකිරීම.
2. හාල්දඹුවන අමුන බැම්ම වැඩිදියුණුකිරීම.
3. හොරගොල්ල ඇල වැඩිදියුණුකිරීම.
4. මොරකැලේ කොස්වතු ඔය වැඩි දියුණුකිරීම.
5. කොට්ටරාමුල්ල හෙවත් බැම්මේ රෙගුලේටරයක් ඉදිකිරීම.
6. වීරගේන කොක්වලමුල්ල ඇල වැඩිදියුණුකිරීම.
7. තඹරාවිල බෝක්කු දෙකක් ඉදිකිරීම.
8. තඹරාවිල අංක 1 දෙපා ඇල වැඩිදියුණුකිරීම.
9. තඹරාවිල අංක 2 දෙපා ඇල වැඩිදියුණුකිරීම.
10. සන්දනන්ගම බක්මීගහ වැව වැඩිදියුණුකිරීම.
11. පල්ලේකැලේ ඔය බැම්ම වැඩිදියුණුකිරීම.
12. ඉහල පුලියන්කුලම දෙමට වැව වැඩිදියුණුකිරීම.

එක එක වැඩය වෙනුවෙන් රුපියල් දහයක මුදලක් තැන්පත් කිරීමෙන් 1960 මැයි 17 වැනි දින පස්වරු 3 වනතුරු ගණන් යෝජනා ආකෘතිපත්‍ර ලබා ගත හැක. සමුපකාර ආයතන සහ ග්‍රාම සංවර්ධන සමිති ගණන් යෝජනා ආකෘතිපත්‍ර ලබා ගැනීමේදී මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නොවේ.

ගණන් යෝජනා පත්‍ර විවෘත කිරීම 1960 මැයි මස 18 වැනි දින පෙරවරු 10 ට පටන් ගන්නවා ඇත. ඒ වේලාවට ඉල්ලුම්කරුවන්ටද පෙනීසිටීමට අවසර තිබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුද්ගලිකව හෝ ලියවිල්ලකින් විමසීමෙන් මගෙන් ලබාගත හැක.

වී. කේ. රාජරත්නම්,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1960 අප්‍රේල් 29,
පුත්තලම කච්චේරිය.

---

## රබර් ගස් විකිණීම

කෑගල්ල දිස්ත්‍රික්කයේ බෙලිගල් කෝරළේ ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ, අල්ගම සහ ගොඩවෙල වසම් වලට අයත්, මේෆේපයාර් වත්තේ අක්කර 50 ක පමණ ප්‍රමාණයෙහි පිහිටි, හෙවත් එම වත්තේ කට්ටි සැලැස්මේ අංක 2, 5, 6, 7, 9, 11, 17, 20, 21, 22, 23, 24, 27, 29, 30, 32, 39, 40, 41, 42, 43, 44, 45, 47, 49, 50, 51, 52, 53, 58, 60, 62, 79, 84, 86, 87, 88, 92, 98, 100, 104, 106, 107 සහ 109 යන බිම් කට්ටි වල පිහිටා ඇති රබර් ගස් කපා ඉවත් කර ගැනීමේ අයිතිය මිළයට ගැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර, වර්ෂ 1960 වේ මැයි මස 20 වැනි දින දවල් 12 වන තුරු කෑගල්ල දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති විසින් භාර ගනු ලැබේ. මෙම රබර් ගස් වලින් ඝණ දර යාර 12,500 ක් කපා ගැනීමට හැකි වෙතැයි ගණන් බලා තිබේ. රබර් ගස් කපා ඉවත් කර ගැනීමේ අයිතිය දෙනු ලබන්නේ ඉතාම වැඩි මිළක් සඳහන් කරන ටෙන්ඩර්කරුටය. කොළඹ-නුවර ප්‍රසිඬ පාරේ 32½ වැනි සැතපුම් කණුව අසලින් හැරී ඉහත සඳහන් රජයේ වත්තටම රථවාහන ගමන් කළ හැකි පාරක් තිබේ.

2. කෑගල්ලේ රජයේ දිසාපතිගෙන් ලබාගත් ටෙන්ඩර් පෝර්ම වල ටෙන්ඩරය පුරවා එවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, සීල් තබා, එහි මුදුනේ වම් කෙළවරේ "මේෆේපයාර් වත්තේ රබර් ගස් මිළයට ගැනීම සඳහා ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කර කෑගල්ලේ රජයේ දිසාපති නමට එවිය යුතුයි.

3. කොළඹ මුදල් භාණ්ඩාගාරයේ හෝ දිවයිනේ ඔනෑම කච්චේරියක එක් ටැන්ඩරයක් සඳහා රුපියල් 10 ක මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් කෑගල්ලේ ආණ්ඩුවේ දිසාපති තුමාට ඉදිරිපත් කිරීමෙන් ටැන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ පෙරවරු 11 දක්වා ලබාගත හැක. පොරොන්දු පත්‍රයක් අත්සන් කළාට පසුව මෙම තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ටැන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටැන්ඩර් පත් ලියාපදිංචි කළ තැපෑලෙන් නොඑවතොත් ටැන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් සීල් තබා කවරයේ මුදුනේ වම් කෙලවරේ "මේෆේපයාර් වත්තේ රබර් ගස් මිළයට ගැනීම සඳහා ටැන්ඩරය" කියා සඳහන් කොට ටැන්ඩර්කරුගේ නම සහ ලිපිනයද එහි සඳහන් කර කෑගල්ලේ කච්චේරියේ කායඹාල සහකාර නිලධාරි තුමා අසල තබා ඇති ටැන්ඩර් පෙට්ටිය තුළට දැමිය යුතුයි.

5. ටැන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියළු ටැන්ඩර් කරුවන් වෙත දන්වා එවනු ලැබේ. ටැන්ඩර් පත්‍ර අවසාන වශයෙන් භාරගන්නා දිනයේ සිට දින 4 ක් ඇතුළත දී යම් ටැන්ඩර් කරුවෙකුට එවැනි දැන්වීමක් නොලැබුණහොත් ඔහු විසින් කෑගල්ලේ ආණ්ඩුවේ දිසාපති තුමාගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

6. ටැන්ඩර් කරුවන්ට වුවමනා නම් ටැන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේ දී පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ. ටැන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වන ඉහත කී දිනයේ සඳහන් වේලාවට කෑගල්ලේ කච්චේරියේ දී ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

7. නියමිත පෝර්මයේ ලියා නැති හෝ එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටු වී නැති කිසිම ටැන්ඩර් පත්‍රයක්, ටැන්ඩර යක් ලෙස සලකනු නොලැබේ. ටැන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිලි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවායේ යම් කිසි වෙනසක් කළ හොත් ඒ තැන්වල ටැන්ඩර්කරුගේ කෙටි අත්සන තැබිය යුතු ද වේ.

8. ටෙන්ඩර්කරුවන් නම, ගම සහ ලිපිනය පැහැදිලි අකුරෙන් ටැන්ඩර් පත්‍රයෙහි සඳහන් කළ යුතුයි.

9. ටෙන්ඩර් පත්‍රයක් පිළිගත් පසු ඒ බව එම ටෙන්ඩරය එවූ තැනැත්තාට දන්වා දින 20 ඇතුලත දී එම ටෙන්ඩරයේ සඳහන් මුළු මුදල ගෙවා කොන්ත්‍රාත්තුව කරගෙන යාම සඳහා දිසාපති තුමා සමග පොරොන්දු පත්‍රයකට අත්සන් කළ යුතුයි. එම ටෙන්ඩර්කරු එම කාලය ඇතුලත දී එසේ ගස් මිලයට ගැනීමට ටෙන්ඩරයේ සඳහන් කළ සම්පූර්ණ මුදල ගෙවීමට අසමත් වුවහොත් ටෙන්ඩර් පෝර්මය ගැනීම සඳහා ඔහු තැන්පත් කළ මුදල රාජසන්තක වනවාත් හැර ඔහුගේ නම රජයේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත් කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වන්නට ද ඉඩ තිබේ.

10. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම තෝරාගනු ලැබූ ටැන්ඩර් කරුවා විසින් ගෙවිය යුතුයි.

11. ටැන්ඩර්කරුවන් විසින් ටැන්ඩර් පත්‍ර භාරගැනීම අවසාන කර මාසයක් ඇතුළත කාලයේ දී එම ටැන්ඩර්වල සඳහන් ගණන් රජයට පිළිගැන්විය හැකි පරිදි විවෘතව තැබිය යුතුයි.

12. තෝරාගනු ලැබූ ටැන්ඩර්කරුවාට රබර් ගස් කපා ඉවත් කර ගැනීමේ අයිතිය පවරනු ලබන්නේ ඔහු විසින් ටැන්ඩරයේ සඳහන් මුදල සම්පූර්ණයෙන් රජයට ගෙවා කෑගල්ලේ ආණ්ඩුවේ දිසාපති තුමා සමග පොරොන්දු පත්‍රයකට අත්සන් තැබුවාට පසුවය.

13. කොන්ත්‍රාත්තුව හිමිවන ටෙන්ඩර්කරුවා විසින් රබර් ගස් කපා කොටා දර ගොඩගැහීම සහ ඒවා පාර අද්දරට ගෙන ඒම ආදිය සඳහා ලාංකික කම්කරුවන් යොදා ඔවුන්ට නියමිත කුලිය ගෙවිය යුතුය.

14. සතුටුදායක ලෙස කොන්ත්‍රාත්තුව කරගෙන යාම සඳහා පොරොන්දු පත්‍රයක් අත්සන් කොට මාස පහක් (5) ගතවන්නට පෙර රබර් ගස් කපා ඉවත් කර ගැනීම අවසන් කළ යුතුයි.

15. කොන්ත්‍රාත්කරු විසින් කෑගල්ලේ ආණ්ඩුවේ දිසාපති තුමාගේ හෝ එතුමා විසින් පත්කරන ලද වෙනත් නිළධාරියෙකුගේ හෝ නිළධාරීන්ගේ පාලනය සහ විධාන යටතේ රබර් ගස් කපා ඉවත් කරගත යුතුවාක් මෙන්ම එම විධානයන්ට හෙතෙම යටත් විය යුතුය.

16. සියළුම හෝ ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමේ හෝ භාරගැනීමේ බලය සහ ඕනෑම ටෙන්ඩරයක කොටසක් භාරගැනීමේ බලය ද කෑගල්ලේ ආණ්ඩුවේ දිසාපති තුමාට පැවරී ඇත.

17. කොන්ත්‍රාත්කරුට භාර දිය යුතු දැන්වීම ඔහුගේ අතට පුද්ගලිකව දුන්නොත් හෝ ඔහු විසින් සපයන ලද ඔහුගේ ලිපිනයට තැපෑලෙන් යැවුවහොත් එම දැන්වීම ඔහුට භාරදුන්නා ලෙස සැලකිය යුතුයි.

18. 1934 රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥපනතේ (11 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම් කිසි සේවකයෙකු හෝ සේවකයන් වෙනුවෙන් වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු රජය නිදහස් කළ යුතුයි.

19. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවකු කොන්ත්‍රාත්කරු විසින් වැඩට ගැනීම ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය රජය තබාගනු ලැබේ.

20. දනෝවිට, මේණ්ෂපයාර් වත්තේ පරීක්ෂක තැනට කල් තබා දැනුම්දීමෙන් පසු දිනයක් නියම කරගෙන මෙම රබර් ගස් රජයේ වැඩ කරන දිනයකදී පරීක්ෂාකර බැලිය හැක.

ඩබ්ලිව්. ඊ. ජයසිංහ,
කෑගලු දිසාවේ දිසාපති වෙනුවට.

1960 අප්‍රේල් 26 වැනි දින,
කෑගල්ලේ කච්චේරියේ දීය.

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරලේ වල්ලකඩුකන්දේ නල මගින් ජලය සැපයීමේ යෝජනා ක්‍රමය

රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරලේ වල්ලකඩුකන්ද ගම පිහිටි ගම් විශාල කිරීම සඳහා දී තිබෙන ඉඩම්වල ජනයාගේ ප්‍රයෝජනය පිණිස නල මගින් ජලය සැපයීමේ යෝජනා ක්‍රමය සඳහා ටැන්ඩර් පත්‍ර වර්ෂ 1960 මැයි මස 20 වෙනි දින පෙරවරු 10 වන තෙක් රජයේ දෙපාර්තමේන්තුවල ලියාපදිංචිවූ කොන්ත්‍රාත් කරුවන්ගෙන් රත්න පුර දිස්ත්‍රික්කයේ දිසාපති තුමා විසින් භාරගනු ලැබේ.

වර්ෂ 1960 මැයි මස 18 වෙනි දින පෙරවරු 11 දක්වා රත්නපුර කච්චේරියෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල ටැන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටැන්ඩර් ආකෘති පත්‍ර දෙනු ලබන්නේ රත්නපුර කච්චේරියේ රුපියල් විසිපහක් (25) තැන්පත් කොට ලබාගත් කුවිතාන්සිය ඉදිරි පත් කළ පසුවය.

ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. එසේ නැත්නම් කොන්ත්‍රාත්කරුවන්ට ටැන්ඩර් පත්‍ර ඔවුන් අතින්ම හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ අතින් පහත සඳහන් අයට භාරදිය යුතුයි.

ටැන්ඩර් පත්‍ර සීල්තබා පිට කවරයේ වම් කෙලවරේ "වල්ලකඩුකන්දේ නල මගින් ජලය සැපයීමේ යෝජනා ක්‍රමය" යනු සඳහන් කළ යුතුයි. එසේම පිට කවරයේ තමන්ගේ නම සහ ලිපිනය සඳහන් කිරීමද අත්‍යාවශ්‍යය.

වැඩය සඳහා ඉල්ලුම් පත්‍ර පිටපත් දෙක බැගින් එවිය යුතුයි. ටැන්ඩර් ඉල්ලුම් පත්‍රවල දෙවෙනි පිටපත පරීක්ෂාකර බැලීමට අවශ්‍යයයි හැඟෙතොත් ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තුමාගෙන් ඒ සඳහා අවශ්‍ය විධි විධාන සලස්වා ගත හැක.

ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර ගැන සලකා බැලීම පිණිස වර්ෂ 1960 මැයි මස 20 වෙනි දින පෙර වරු 10ට කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපිටදී ඒවා විවෘත කරණු ලබන හෙයින් ඒවා ඉදිරිපත් කළ කොන්ත්‍රාත්කරුවන් සියලු දෙනාට එදින නියමිත වේලාවට මෙම කච්චේරියේ ටැන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය හැක.

ටැන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට පළමු තමා ඉල්ලුම් කරණ වැඩය ගැන සියලු විස්තර තමාම පරීක්ෂාකර බලාගත් බැව් ඉල්ලීම ගැන සැලකීමේදී හඟිනු ලැබේ.

වැඩි විස්තර රත්නපුර කච්චේරියෙන් ලබාගත හැක.

එච්. ඩී. ධර්මසේන,
රත්නපුර දිසාපති වෙනුවට.

1960 අප්‍රේල් මස 30 වෙනි දින,
රත්නපුර කච්චේරියේ දීය.

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

පොලොන්නරුවේ තානායම් පියැදුරු කෙනෙකුට කාමරයක් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්ත මේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 25 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පොලොන්නරුවේ ආ. වැ. දෙපාතීමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 5,500 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමූපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති, සහ

(ඈ) සමූපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමූපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දිය., 1960. 5. 2.

---

පොලොන්නරුවේ තානායමේ වහල අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්ත මේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 25 වෙනි බදාදා පෙරවරු 10.30 වන

තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පොලොන්නරුවේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කායඝාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 20 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 6,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත්කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය., 1960. 5. 2.

---

පොලොන්නරුවේ තානායමේ සිමෙන්ති පොලව අළුත්වැඩියා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 මැයි මස 25 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පොලොන්නරුවේ ආ. වැ. දෙපාතීමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 20 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 7,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය., 1960. 5. 2.

---

යාපනේ විධායක ඉංජිනේරු තැනගේ කාර්යාලය විශාල කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ජූනි මස 1 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30 ට ටෙන්ඩර් කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. යාපනේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක්ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 20 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාතීමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 18,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාතාකරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 25 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය., 1960. 5. 2.

---

මුතුරාජවෙල අඩි 120 ක පාලම් සෑදීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 ජූනි මස 1 වෙනි බදාදා පෙරවරු 9.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන එමදින පස්වරු 2.30 ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කොළඹ, ටොරිංටන් චතුරශ්‍රයේ ආ. වැ. දෙපාතීමේන්තුවේ උතුරු කොළඹ විධායක ඉංජිනේරුතැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 මැයි මස 20 වෙනි සිකුරාද පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ පාලම් වැඩ සඳහා රුපියල් 65,000 ට නොඅඩු ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියා පදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රුපියල් 100 ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට, මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටැන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන., නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන්"

(ඇ) ග්‍රාමසංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාමසංවර්ධන සමිති, සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ජේ. ඩබ්ලිව්. ද අල්විස්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
අධ්‍යක්ෂක වෙනුවට.

කොළඹ, ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය., 1960. 5. 2.

# බඩු බාහිරාදිය විකිණීම්

## ස්වදේශීය වෛද්‍ය දෙපාර්තමේන්තුව

### අබලන් බඩු බාහිරාදිය විකිණීම

පහත දක්වන බඩු බාහිරාදිය 1960 මැයි 18 වැනි බදාදා සවස 2 ට, කොළඹ 8, කෝට්ටේ පාරේ ස්වදේශීය ආරෝග්‍යශාලා භූමියේ දී වෙන්දේසියේ විකුණනු ලැබේ :—

ගෙවූ බඩුවලට ගාස්තු ගෙවා එවේලේම ගෙන යා යුතුයි.

| | |
|---|---|
| අඩි කෝදු ... ... | 2 |
| අත් බුරුසු ... ... | 2 |
| අත් සීනු ... ... | 1 |
| ඇලුමිනියම් කොප්ප ... | 6 |
| ඇඳ ඉහ වාර්තා රාමු ... | 13 |
| ඇනමල් බේසම් ... ... | 33 |
| ඇඳි සහිත පුටු ... ... | 3 |
| ඇනමල් පුනීල ... ... | 10 |
| ඇලුමිනියම් භාජන ... | 9 |
| ඇලුමිනියම් කේතල් ... | 1 |
| ඇනමල් කිරි භාජන ... | 1 |
| ඇඳන් ... ... | 4 |
| ඇඳ කුඩු ඉහ ... ... | 1 |
| ඇනමල් භාජන (ලොකු) ... | 16 |
| ඉදල් ... ... | 12 |
| ඉස්ප්‍රිට් ලාම්පු ... ... | 1 |
| උණු වතුර බඳුන් ... | 1 |
| උණ ලකුණු කරන කොළ දමන තහඩු | 9 |
| කතුරු ... ... | 5 |
| කොහු ... ... | 107 |
| කොහු පාපිසි ... ... | 1 |
| කෝට් එල්ලන බෝලකුඩු ... | 10 |
| කුණු කූඩා ... ... | 26 |
| ගැණීමට භාජන අඬු ... | 2 |
| කෙළ ගසන භාජන පියන් සහිත | 17 |
| මොප් ... ... | 1 |
| ඩී. ඩී. ටී. විහිදුවන උපකරණ ... | 1 |
| නාන බාල්දි (ගැල්වනයිස්) ... | 4 |
| නාම පුවරු ... ... | 1 |
| නැමිය හැකි ස්ක්‍රීන් ... | 7 |
| තරාදි (වෙළඳ) ... ... | 1 |
| තරාදි ... ... | 1 |
| තීන්ත කූඩු ... ... | 15 |
| තුවා දමන ස්ටෑන්ඩ් ... | 1 |
| තාච්චි ... ... | 1 |
| දිග බංකු ... ... | 9 |
| දිග මේස ... ... | 1 |
| පින්සල් ... ... | 1 |
| පෙට්ටි ... ... | 1 |
| පීප්ප (කරාමය සහිත) ... | 6 |
| පුටු ... ... | 7 |
| පොඩි පිඟිය ... ... | 12 |
| පිඟිය (උදුන්ගෙයි පාවිච්චි කරන) | 3 |
| බාල්දි (ගැල්වනයිස් ලොකු) ... | 7 |
| බුරුසු (කාණු සෝදන) ... | 13 |
| බේසම් තබන යකඩ ... | 1 |
| බැංකු (ස්ටූල්) ... ... | 1 |
| බාල්දි ... ... | 16 |
| බිත්ති බෝලකුඩු ... | 2 |
| මේස පිඟිය ... ... | 3 |
| මේස හැඳි ... ... | 4 |
| මිට දිග යකඩ හැඳි ... | 18 |
| මෝල් ගස් ... ... | 18 |
| සෝපා ... ... | 1 |
| යකඩ ඇඳන් ... ... | 1 |
| රෝගී පරීක්ෂා කරණ සෝපා ... | 1 |
| රේක්ක ... ... | 3 |
| රාක්ක ලොකු ... ... | 1 |
| ලොකු බංකු ... ... | 8 |
| ලී රාමු සහිත තඹ පෙනේර ... | 10 |
| ලී පියන් ... ... | 6 |
| ලී ස්ක්‍රීන් ... ... | 6 |
| ලී ට්‍රේ ... ... | 5 |
| වැසිකිළි බාල්දි ... ... | 1 |
| වේවැල් ස්ක්‍රීන් ... ... | 5 |
| විදුලි පන්දම් ... ... | 8 |
| ස්කැපැල් පිඟිය ... | 3 |
| සිදුරු ඇති ඩෙස්ක් ... | 1 |
| සොයිබ තහඩු ... ... | 8 |
| ස්පියුලා වානේ ... ... | 2 |
| සෝදන උපකරණ ... | 1 |
| හාන්සි පුටු ... ... | 4 |
| හිරමන ... ... | 2 |
| හරිකේන් ලන්තෑරුම් ... | 1 |
| ටැරසෝ තහඩු ... ... | 6 |
| ගැලුමේ ෂෙල්ටොක්ස් ටින් (හිස්) ... | 110 |
| ගැලුම් පහේ ටින් (හිස්) ... | 57 |
| ගැලුමේ ටින් (හිස්) ... | 88 |
| හිස්ගෝනි ... ... | 155 |
| හිස් ලී පෙට්ටි ... ... | 31 |
| පත්තර—රුත්තල් ... | 114 |
| රට අඹ ලෑලි (ගොඩවල්) ... | 1 |
| ගෑස් ලිප් (පරණ) ... | 1 |
| යෝල් යතුරු තහඩු ... | 31 |
| යකඩ හැඳි ... | 1 |

ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු,
සවදේශීය වෛද්‍ය සංවර්ධන කොමසාරිස්.

කොළඹ 8,
1960.4.29.

---

## දැන්වීමයි

හිස් පකිස් පෙට්ටි, පීප්ප සහ ටින් යනාදිය විකිණීමට ප්‍රසිද්ධ වෙන්දේසියක් 1960.5.16 වෙනි සඳුදා පස්වරු 1 ට මරදානේ දුම්රිය බඩු ගබඩාවේදී පැවැත්වෙයි.

විකුණූ දින සිට දවස් තුනක් ගතවූ පසු ඉවත් කරනු නොලැබූ සෑම කොටසකටම දිනකට ශත පණහක කුලියක් අයකරනු ලැබේ.

සැ. ඕ. පෙ. රූපසිංහ,
දුම්රිය ගබඩා අධිකාරී.

1960.4.25 වෙනි දින,
කොළඹ දුම්රිය ගබඩාවේදීය.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අයකරනු ලබන සංශෝධිත ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරනු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරන කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හෝ නමක් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් හෝ පළ කරනු නොලැබේ.

9. උසාවියේ අණ පනත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නො ලැබේ.

10. දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා 1955 ජනවාරි 1 වැනි දින සිට අය කරන ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 60 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 120 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30ට ප්‍රථමයෙන්).

13. ගැසට් පත්‍රය සඳහා දායක මුදල් වසකට හෝ ඉන් අඩකට කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැන විසින් කලින් භාරගනු ලැබේ.

14. දායක මුදල් :—

| | | රු. | ශ. |
|---|---|---|---|
| වාර්ෂික දායක මුදල ... ... | එක් කාණ්ඩයක් සඳහා ... | 15 | 0 |
| | I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | 7 | 0 |
| සෑම කාණ්ඩයකම එක් කොටසක පිට පතකට ... ... | ... ... | | 25 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 31 |
| I වෙනි කාණ්ඩයේ එක් කොටසකට ... | ... ... | | 10 |
| | තැපැල් ගාස්තුවත් සමග ... | | 14 |

15. පරණ ගැසට් කොපි තිබේ නම් ඒ සඳහා ගාස්තුව දෙගුණයක් වේ. මෙය කොළඹ රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරි තැනගෙන් ඉල්ලුම් කළ යුතුයි.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.